
# ලක්ෂ්මන් අබේකෝන්

**Lakshman Abeykoon** **M. Sc.(Agri.) ; Grad. Dip. (Libr.)**
*5/24 Kelvinside Road Noble Park*
*Vic. 3174 - Australia*
**Phone (03) 9548 1613**
http://jyotisha.00it.com


# 2008 ලග්න පලාපල



## මේෂ ලග්නය

ගුරුගේ හා රාහුගේ දශා අතුරුදශා ගතවන අයට පවතින අනිකුත් අපල වලට ප්‍රතිකර්ම කරනවානම් මෙය සුබදායක කාලයක් නිසා පහත කියන සුබපල තරමක් වැඩිපුර ලැබෙන්නට පුලුවනි

සෙනසුරුගේ හා කේතුගේ දශා අන්තර්දශා ගතවන අයට දැනට පවතින ග්‍රහඅපල ආදියට නිතර නිතර ප්‍රතිකර්ම කලේ නැතිනම් මෙය තරමක අසුබ කාලයක් නිසා මෙම වසරේදී ලැබිය යුතු සුබපල අඩුකරන්නට පුලුවනි ඒනිසා මේකාලයේදී පවතින අපල වලට නිතර ශාන්තිකරම ආදිය කිරීමෙන් මෙම වසරේදී වඩාත් සුබදායක ප්‍රතිපල ලබාගන්නට පුලුවනි

## රැකීරක්ෂා හා ධනය

විභාග හෝ සම්මුඛ පරීක්ෂන ආදියෙන් ඡයවේ පිටපලාත් වලදී කරන කටයුතු වලින් සහ පිටපලාත්වල අය සමග කරන ගනුදෙනු වලින් ලාභ ප්‍රයෝජන ලැබේ පූජකයන්ගෙන්ද අන්‍ය ආගමිකයන්ගේද අන්‍ය ජාතිකයන්ගේද ආශ්‍රය ඇතිවීමත් ඔවුන්ගෙන් උපකාර ලැබීමත් නියමයි උසස් ධර්ම ශාස්ත්‍ර ගැන දැනීමක් ලබාගැනීමට ඉඩතිබේ අන්‍ය භාෂාවන් පවා මේකාලයේදී ඉගනීමට සිත්දේ තදලෙස දූරගමන් බලපවත්වන කාලයකි පියාට හෝ පියපක්ෂයේ ඥාතීන්ට යහපත් කාලයකි පිටපලාත්වල වාසයට හෝ ආශ්‍රයට යාමට හොදම කාලයි දරු ශිෂ්‍ය ලාභ මිලමුදල් ලාභ ඇතිකරන කාලයකි අලුත් තත්වයක් ඇතිවේ ආදායම් වැඩිවීමටද ඉඩතිබේ

ගෙවල් ඉඩම් හෝ ඒවා සෑදීමට අවශ්‍ය උපකරන හෝ ගෘහභාන්ඩාදිය පහසුවෙන් ලැබෙනවා ඇත

විශේෂයෙන් රාහු හා ගුරු දශා අන්තර්දශා ගතකරන මේශ ලග්න හිමියන්ට ඉහත කී සුබපල වැඩිපුර ලැබන්නට පුලුවනි අන් අයට මධම පලයි

## ගෘහ ජීවිතය

රාහු හා ගුරු දශා අන්තර්දශා ගතකරන මේශ ලග්න හිමියන්ට වාසනාවන්ත කාලයකි තම රැකීරක්‍ෂා තනතුරු ආදිය දියුනුවේ අලුත් මිත්‍රයන් නෑදෑයන් ලැබෙන්නටද පුලුවන උසස් අය සමග ආශ්‍රය කිරමටත් ඔවුන් සමග හිත මිත්‍රකම් පැවැත්වීමටත් අවස්තාව ලැබෙන්නට පුලුවන පවුලේ දියුනුවටද හේතුයි

නමුත් සෙනසුරුගේ හා කේතුගේ දශා අන්තර්දශා ගතවන අයට පවතින අපල වලට නිසි ශාන්තිකර්ම ආදිය කලේ නැතිනම් ශනි 5 වැන්නේ ගමන්කරන කාලයේදී බලාපොරොත්තු අදහස්ද අනුන් සමග වූ පොරොන්දු ගිවිසුම් ආදියද වෙනස්වීමට ඉඩ ඇති කාලයකි පහසුවෙන් බේරුමක් කර ගතහැකිව තිබූ අවුල් වියවුලු ආදිය පිලිබදව ලොකු කරදර වලටද පැටලිලිවලටද පත්වේ සුලුදේ ලොකුවට පත්වීමෙන් අමාරුවට වැටේ මේවා වැඩිපුර සිදුවන්නේ හිත දමනය කරගැනීමට නුපුලුවන්කම නිසාය සුලුවරදනිසා ලොකු දඩුවම් ලැබෙන කාලයකි

## සෞඛ්‍යය

අපල වලට නිසි ශාන්තිකර්ම ආදිය මේකාලයේදී නිතර කිරීම සුදුසුයි එසේ කලේ නැතිනම් කේතු හා සෙනසුරු 5 ස් වැන්නේ ගමන්කරන නිසා තමපවුලේ අයට අසනිප කරදර හෝ තදබල අපල ඇතිකල හැකි කාලයකි කරදර සහිත කාලයකි ඇවිදිලි වැඩිවේ බඩේ අසනිපයක් සෑදේ පවුලේ දරු ලාභද ඇතිවිය හැකි කාලයකි අධික වියදම් සහිතය සිතට භය ඇතිවන කාලයකි දරු ශිෂ්‍යයන් නිසා අධික වියදම් දරන්නට සිදුවේ

## වෘෂභ ලග්නය

රාහුගේ දශා අතුරුදශා ගතවන අයට පවතින අනිකුත් අපල වලට ප්‍රතිකර්ම කරනවානම් මෙය සුබදායක කාලයක් නිසා පහත කියන සුබපල තරමක් වැඩිපුර ලැබෙන්නට පුලුවනි

ගුරුගේ සෙනසුරුගේ හා කේතුගේ දශා අන්තර්දශා ගතවන අයට දැනට පවතින ග්‍රහඅපල ආදියට නිතර නිතර ප්‍රතිකර්ම කලේ නැතිනම් මෙය තරමක අසුබ කාලයක් නිසා මෙම වසරේදී ලැබිය යුතු සුබපල අඩුකරන්නට පුලුවනි ඒනිසා මේකාලයේදී පවතින අපල වලට නිතර ශාන්තිකරම ආදිය කිරීමෙන් මෙම වසරේදී වඩාත් සුබදායක ප්‍රතිපල ලබාගන්නට පුලුවනි අන් අයට මධම පලයි

## රැකීරක්‍ෂා හා ධනය

ශනි 4 වැන්නේ ගමන්කරන මෙම කාලයේදී ශනිට ගුරුගෙන් සුභ දෘෂටි ලැබීම නිසා අලුත් බලාපොරොත්තු වලින් සිතේ ප්‍රීතිය ඇතිවේ අලුත් වැඩකට හෝ

රක්‍ෂාවකට යාමටද සිද්‍ධවීමට පුළුවන දේපල ලාභ ඇතිවේ වැඩිහිටි අයගෙන් ආධාර උපකාරලැබේ පරන වූ වැඩක් අලුත්වී මතුවේ පරන බඩු පරන වාහන හෝ පරන ගෙවල්දොරවල් ප්‍රතිසංස්කරනය කර දියුනුකර ලැනිමට ඉඩකඩ ඇතිවේ ඉඩකඩම් හෝ යාන වාහන වැනි දේපල සම්බන්ධ කටයුතුද ඇතිවිය හැක දේපල පිලිබද ඔප්පු ලිවීම් ආදිය ඇතිවිමද මේ කාලයේ සිද්‍ධවිය හැක දේපල බෙදීම්ද විකිනීම් හෝ මිලදීගැනීම් වැනි අන්‍ය උරුමක් කාරයන් ඇතිවීම්ද සිද්‍ධවිය හැකි කාලයකි

එසේ වුවත් රාහු දසවැන්නේ ගමන් කරන බැවින් මෙම කාලයේදී උසස් අය හෝ තම සවාමියන් සමග හෝ වැඩ කරුවන් නැතිනම් තමා සමග වැඩ කරන අයගෙන් කරදර හා හිරි හැරද ඇතිවන්නට ඉඩ ඇත ගමන් අධිකවේ නමුත් එම ගමන් වලින් ප්‍රයෝජන අඩුවේ නිතර කයට වෙහෙස මහන්සි ගතියක් ශක්තිය අඩු ගතියකි හෝ අසනීප ගතියක් දැනේ කරගෙන ආ කටයුතුවල අවහිරකම් ඇතිවෙන කාලයකි වෙහෙස ඇති සතුටක් නැති ගමන් යාමට සිද්‍ධවීමද රැකීරක්‍ෂාවල තත්වය පිරිහීමද කරන කියන කටයුතුවලින් පාඩු සිද්‍ධවීමද  වැනි අපල ඇතිකරන්නට පුළුවන් නිසා පරිස්සම් විය යුතු කාලයකි එබැවින් පවතින අපල ආදියට සුදුසු පිලියම් කරගැනීම තුලින් මෙම කාලයේදී වාසනාව උදාකරයි

## ගෘහ ජීවිතය

නමුත් පවතින  අපල ආදියට සුදුසු පිලියම්  මේ කාලයේදී කලේ නැතිනම්  ගුරු ග්‍රහයා ඔබේ රාෂි කේන්ද්‍රයේ  8 වැන්න හරහා ගමන් කරන මේ කාලය ටිකක් කරදර සහිත වන්නටද පුළුවනි විශේශයෙන් හදිසි අනතුරුහෝ අසනීප වලින් පරිස්සම් වියයුතුය චෝදනා අපවාද අපකීර්ති ලැබෙන්නට ඉඩ තිබෙන නිසා තත්වයට නොසුදුසු වැඩ නොකිරීමට සිතට ගතයුතුයි නැතිනම්  අනාගතය ගැන සිත සිතා කනගාටුවීමට සිද්‍ධවේ අවාසනාවන්ත වෙනස් වීමක් ඇතිවීමට හෝ නැතිනම් තමා ගැන බොරු නරක ආරංචි පැතිරීමට පුළුවන් කාලයකි සිතට භය හා තද තිගැස්සීම් ඇතිවේ

## සෞඛ්‍යය

ශනි 4 වැන්නේ ගමන්කරන කාලයේදී ශරීර සනීපය අඩුවේ වාත රෝග වැනි අසනීප වැලදීමට පුළුවන පවුලේ වැඩිහිටියෙකුටද  අපල දායක කාලයකි ශරීර අසනීප ගතිද මතුවේ උන ආබෘධ ආහාර නොදිරවීමේ රෝග ලේ දෝෂ සාදන්නට පුළුවන විශේශයෙන් හදිසි අනතුරු වලින් ප්‍රවේසම් විය යුතුය දුරගමන් වලට බැසීමට අසුබ කාලයකි

# මිතුන ලග්නය

ගුරුගේ සෙනසුරුගේ හා කේතුගේ දශා අතුරුදශා ගතවන අයට පවතින අතිකුත් අපල වලට ප්‍රතිකර්ම කරනවානම්  මෙය සුබදායක කාලයක් නිසා පහත කියන සුබපල තරමක් වැඩිපුර ලැබෙන්නට පුළුවනි

රාහුගේ දශා අන්තර්දශා ගතවන අයට දැනට පවතින ග්‍රහඅපල ආදියට නිතර නිතර ප්‍රතිකර්ම කලේ නැතිනම්  මෙය තරමක අසුබ කාලයක් නිසා මෙම වසරේදී ලැබිය යුතු සුබපල අඩුකරන්නට පුළුවනි ඒනිසා මේකාලයේදී පවතින අපල වලට

නිතර ශාන්තිකරම ආදිය කිරීමෙන් මෙම වසරේදී වඩාත් සුබදායක ප්‍රතිපල ලබාගන්නට පුලුවනි අන් අයට මධම පලයි

## රැකීරක්‍ෂා හා ධනය

අනුමානයට කරන ඩැඩ සාර්තකවී දියුනුව ලැබේ අලුත් දේ ඉගනීමට ලැබේ නැතිවූ වස්තු නැවත ලැබේ සෙනසුරු තුන් වැන්නේ ගමන්කරන කාලයේදී ධන ලාහ ලැබේ සිත ප්‍රීතිමත් කාලයකි දියුනුව ඇතිවේ කරගෙන ආ කටයුතු මෙන්ම අමුතුවෙන් ආරම්භ කරන කටයුතු ද දියුනුවේ නමුත් වියදම් අධික කරයි තත්වය උසස්වේ සතුරන්ගෙන් ජය ලැබේ තම බලය වැඩිවේ දේපල ලාහ ලැබේ නීතිය පිලිබද කටයුතු වලට පැටලියහැක අයිතිවාසිකම් ලැබේ උසස් අය හා ආශ්‍රය ඇතිවේ උසස් අයගෙන් උපකාරද ලැබේ ලොකු ලාබ පවා ලැබෙන්නට ඉඩ තිබේ වාසනාවන්ත කාලයකි

## ගෘහ ජීවිතය

ගෙදර දොර වාසනාවනත කාලයකි මංගල යෝග දරු ශිෂ්‍ය ලාහාදිය ලැබෙ සිතට කයට සැප එලවන සියලු දේ ලැබෙන කාලයකි හොද ආහාරපාන වර්ගද වාහනද ලැබෙන්නට පුලුවනගත් ගමන් යාමට ලැබේ උසස් ස්ත්‍රීන් හෝ පුරුෂයන් සමග ආශ්‍රයට වැටේ සිත් ප්‍රීතියට කටයුතු සැලසේ කලක සිට බලාපොරොත්තුව සිටි අදහසක් ඉෂ්ඨවේ වැඩි උත්සාහයක් නැතිවම මිල මුදල් ලාහද ලැබෙන්නට හේතුයි උත්සව වලට හෝ සමාගම් වලට ආරාධනා ලැබේ සමාජයෙහි තම තත්වය ඉහලයයි පවුලේ විවාහ මංගල්‍ය වැනි ප්‍රීති උත්සව ඇතිවේ ජීවිතයේ එක් අමුතු උදාවක් ඇතිකරන කාලයකි අලුත් හිතමිතුරන් ඇතිවේ පවුලේ වැඩිදියුනුවද ඇතිවේ

නමුත් විශේශයෙන් රාහුගේ දශා අන්තර්දශා ගතවන අයට දැනට පවතිනඅපල ආදියට බෝධිපූජා ආදිය නිතර කලේ නැතිනම් කේතු දෙවැන්නේ ගමන් කරන මේ කාලයේදී ලැබෙන්නට ඔන්න මෙන්න කියා තිබියදී ලැබිය යුතු මිල මුදල් ලාහ අඩු කරන්නට පුලුවන් කාලයකි වියදම් අධික වේ අලාහ හානි සිදුවේ කලකෝලාහල වලටද පැටලෙන්නට පුලුවන නොතේරුම් කමින් කරගන්නා පාඩු හා විපත්තිද කරදර හා අනතුරු වලටද මුහුනපාන්නට සිදුවේ බලාපොරොත්තු රහිත දෙයින් කරදර වලටත් අවාසනාවන්ත කම් වලටත් වැටෙන්නට පුලුවන රැකීරක්‍ෂා හා බලාපොරොත්තු කටයුතු අවුල් වීමත් කරන රැකියාවේ හෝ වැඩකරන ස්තානයේ කරදර නිසා එදිනෙදා කරන කටයුතත් ෘ කරදර සහිතව කරන්නට සිදුවේ නමුත් පවතිනඅපල ආදියට බෝධිපූජා ආදිය නිතර කරනවානම් අන්තිමේදී හිම්හිට එම කරදර අඩුවීයයි

## සෞඛ්‍යය

රාහු අටවැන්නේ ගමන් කරන කාලයේදී කෑම බිම පිලිබද නුසුදුසු කමකින්ද නැතහොත් නියම පෝෂ්‍යදායක ආහාර නොලැබීමෙන් හෝ පලාතේ පවතින සීතල හෝ උස්නාධික කමවැනි විෂමතාවයෙන් හෝ අප්‍රවේසම නිසා අපත්‍ය ආහාර ආදිය ගැනීමෙන් පවුලේ කීපදෙනෙකුම අසනීපවලින් පීඩාවන්නට පුලුවන එම අසනීප අමුතුම අසනීප විය හැක තමාත් සමග එකවැරකීපදෙනෙක්ම අසනීපවන්නට ඉඩ ඇත ඇස්වල හෝ දත්වල ආහාධද වැලදෙන්නට ඉඩ තිබේ ශල්‍ය කර්ම හෝ නැතහොත් බෙහෙත් විදීමක් කරවාලන්නටද සිදුවන්නට පුලුවනි ගෙදර අයටත්

තමන්ටත් හදිසි අසනීප අනතුරු ආදිය හෝ ඇතිවිය හැකිකාලයක් නිසා ටිකක් ප්‍රවේසම් වනවානම් වඩා සුදුසුයි

## කටක ලග්නය

ගුරුගේ රාහුගේ සෙනසුරුගේ හා කේතුගේ දශා අන්තරදශා ගතවන අයට දැනට පවතින ග්‍රහඅපල ආදියට නිතර නිතර ප්‍රතිකර්ම කලේ නැතිනම් මෙය තරමක අසුබ කාලයක් නිසා මෙම වසරේදී ලැබිය යුතු සුබපල අඩුකරන්නට පුලුවනි ඒනිසා මේකාලයේදී පවතින අපල වලට නිතර ශාන්තිකරම ආදිය කිරීමෙන් මෙම වසරේදී වඩාත් සුබදායක ප්‍රතිපල ලබාගන්නට පුලුවනි අන් අයට මධම පලයි

## රැකීරක්ෂා හා ධනය

ලග්න ඒරාශ්ටකය යෙදෙමින් ශනි දෙවැන්නේ ගමන්කරන මේ කාලය අපල දායකයි ඒ නිසා මේකාලයේදී අනුන්ගෙන් ධනය ලැබුනත් එය වැඩිකලක් පැවතීමට හෝ එයින් සතුටුවීමට සිදුනොවේ අධික වියදම් සහිත කාලයකි නිෂ්පල දෙයට ධනය වියදම් වේ මුදල් රදන්නේ නැති කාලයකි ලැබෙන්නට තියෙන මුදල් පවා නොලැබේ සමහරවිට නය ගනුදෙනු වලටද බැදෙන්නට සිදුවේ නැතිනම් ධන හානි හෝ අධික වියදම් ඇතිවේ තිබෙන දේ පවා නිකරුනේ නැති නාස්තිවී යයි නැතිනම් වේයන් මීයන් ආදි සතුන් හෝ පැමින විනාශකර දමයි වාහන ආදිය නැන් තැන්වල දිරාපත්වීමට පුලුවන තද සීතල හා අදුරු හෝ තද උනුසුම් අපිරිසිදු තැන්වල වාසය කිරීමට හෝ එවැනි තැන් වල අවේලාවන් වල නිදිමරාගෙන දුක් විදිමින් වැඩ කිරීමටද සිදුවන්නට පුලුවන කරදර දායක කාලයකි ස්වල්ප වශයෙන් මිස වැඩිපුර ලාභ නොලැබේ ගෙදරදොර පදිංචිය හෝ කාර්යාලීය වෙනසක් තනතුරු ස්තාන වෙනසක් ද සිදුවීමට පුලුවන නමුත් ඉගත ගත්දෙයින් ප්‍රයෝජන ලැබියහැකි කාලයකි

## ගෘහ ජීවිතය

මේ කාලයේදී පවතින සෙනසුරු ගේ ඒරාශ්ටක අපල වලට පිලියම් ආදිය නිතර කරනවානම් සුබයි නැතිනම් පවුලේ අයගෙන් හෝ අන්‍ය හිතවතුන් හිතවතියන්ගෙන් තම සිතට ප්‍රීතියක් ඇතිනොවේ සොර සතුරන්ගෙන් හෝ රැකීරක්ෂාවලින් හෝ අසනීපවලින් කරදරයක් සිදුවේයයි සිතට භය සැක ඇතිවේ කරදර සහිතව කාලය ගෙවේ තද කම්මැලි ගතියක් ඇතිවේ එබැවින් කිසිම ස්තිර වැඩකට බසින්නට සිත නොදේ නිතර නිදාගෙන සිටින්නට හෝ තැන්තැන්වල හාන්සිවී කල්පනා කර කර සිටින්නට කැමතිවේ නිතර ඇනුම් යාමටද හරියට ලොකු මහන්සි ගතියක් ඇතිවෙන්නටද පුලුවනි ගෙදර තම සිත අසතුටට හේතුවන කරුනු ඇතිවේ නුවමනා කරදර වලට අසුවී සමහරවිට නීතියේ පිහිට සෙවීමටද ඉඩතිබේ බොරු චෝදනා වලට අසුවිය හැකිය නිකරුනේ තැන්තැන්වල ඇවිදීමට සිදුවේ පහත් අයගේ රැවටිලි වංචා වලට කල්පනා කාරිව ක්‍රියාකල යුතු කාලයකි නැතිනම් නින්දාවක් හෝ ආරවුලක් නිසා වරදකරුවෙක් සේ පෙනීමටත් දුක් කනගාටු කරදර

ඇතිකිරීමටත් ඉඩ ඇති අලාභහානි කලකෝලහල සතුරුභය ඇතිවියහැකි සහකාරකම් කැඩීබිදියන කරදර දායක කාලයකි

## සෞඛ්‍යය

කේතු ලග්නයේගමන් කරන කාලයේදී ශරීරය දුර්වලවේ මුහුන අවලක්‍ෂන වේ ශරීරයේ තැන්තැන්වල ලප පැල්ලම් හෝ තුවාල සෑදීම හෝ වියලි වැහැරුන ගතියක් ඇතිවීම හෝ සිදුවේ සැප පහසුව අඩුකරයි ශරීරය දුර්වලවීම හෝ ශරීර ලක්‍ෂනය හා පැහැපත්බව අඩුවේ අසනීපවලට හේතුයි දත්මුල් දියවේ දත් සෙලවෙන්නට ගනී අසනීප දුක් විපත් නිසා අධික වියදම් ඇතිවේ ශරීර සනීපය හීනවේ චර්මාභාධ කැසීම් ලිංගාභාධ හෝ මූත්‍ර අමාරු වකුගඩු අමාරු අර්ශශ් ආදිය ඇතිවිය හැක උන ආභාධ හෝ හිසේ අමාරුවැලදේ පවුලේ අයට දූ දරුවන්ට හෝ මවුපියන්ට හා තමාටද අසනීපාදී අපල ඇති කරයි ඒනිසා මේ කාලයේදී පවතින සෙනසුරු ගේ ඒරාශ්ටක අපල වලට පිලියම් ආදිය කරනවානම් සුදුසුයි

## සිංහ ලග්නය

ගුරුගේ හා රාහුගේ දශා අතුරුදශා ගතවන අයට පවතින අනිකුත් අපල වලට ප්‍රතිකර්ම කරනවානම් මෙය සුබදායක කාලයක් නිසා පහත කියන සුබපල තරමක් වැඩිපුර ලැබෙන්නට පුලුවනි

කේතු ගේ දශා අන්තරදශා ගතවන අයට දැනට පවතින ග්‍රහඅපල ආදියට නිතර නිතර ප්‍රතිකර්ම කලේ නැතිනම් මෙය තරමක අසුබ කාලයක් නිසා මෙම වසරේදී ලැබිය යුතු සුබපල අඩුකරන්නට පුලුවනි ඒනිසා මේකාලයේදී පවතින අපල වලට නිතර ශාන්තිකරම ආදිය කිරීමෙන් මෙම වසරේදී වඩාත් සුබදායක ප්‍රතිපල ලබාගන්නට පුලුවනි අන් අයට මධම පලයි

## රැකීරක්‍ෂා හා ධනය

ගුරු ග්‍රහයා ඔබේ රාෂි කේන්ද්‍රයේ 5 වැන්න හරහා ගමන් කරන කාලයයි එබැවින් පවතින සෙනසුරු ගේ ඒරාශ්ටක අපල වලට පිලියම් ආදිය කරනවානම් වැඩ කටයුතු ආදිය සිතැගි පරිදි සිද්ධවේ කලක් නැවතී තිබුන කටයුතුද නැවත පටන්ගැනේ නොයෙක් කටයුතුවලින් ලාභ ලැබේ උසස් නිලතල හෝ රැකීරක්‍ෂා ආදියද ලැබෙන්නට පුලුවන ධන ලාභ ලැබේ ආදායමද හොදවේ ව්‍යාපාර කටයුතුවලිනි ලාභ ලබන්නටත් වාසනාවන්ත තත්වයකට හෝ තැනකට යන්නට හා දියුනුවට මග සැලසේ බලාපොරොත්තු දේවල් ආදිය ලැබේ අදහස් ඉශ්ඨවේ කරගෙන යන කටයුතුද අමුතුවෙන් ආරම්භ කරන කටයුතුද වැඩි දියුනුවට යයි තනතුරු වලින් උසස්වේ යහපත් වැඩකරුවන්ද හිතවත් ආධාර කරුවන්ද ලැබේ අනාගත දියුනුවට හේතුවන වැඩපිලිවලත් ඇතිවේ වැඩිහිටියන්ගෙන් හා උසස් අයගෙන් ආධාර උපකාර ලැබේ අලුත් ස්තානවලට යාමට ඉඩතිබේ වෙලහෙලද ව්‍යාපාර ආදියෙන් හෝ රැකියාවලින් දියුනුව හා උසස්වීම් ඇතිකරන කාලයකි විභාග සම්මුක පරීක්‍ෂන ආදියෙන් ජය ලැබේ වස්තු ලාභ ඇතිකරන කාලයකි

## ගෘහ ජීවිතය

පවතින සෙනසුරු ගේ ඒරාශ්ටක අපල වලට පිලියම් ආදිය කරනවානම් ප්‍රියජනක ස්ත්‍රී පුරුෂාදී ආශ්‍රය ඇතිවේ ගෙදර වාසනාවන්ත ප්‍රීති උත්සව පවත්වන්නට ලැබේ ඇඳුම් පැලඳුම් අලංකාර බඩුබාහිරාදිය හා යහපත් සහකරුවන් නැතිනම් ප්‍රියයන් සමග සම්බන්ධකම් ඇතිවේ පවුලේ දියුනුව හා පවුලට අලුත් සාමාජිකයන් එකතුවීමටද ඉඩ තිබේ

නමුත් පවතින සෙනසුරු අපල වලට පිලියම් කලේ නැතිනම් ශනි ලග්නයේ ගමන්කරන මේ කාලය තුල ටිකක් අපල දායකගතිද ඇති කරන්නට පුලුවන බලාපොරොත්තු රහිත අධික වියදම් සිදුවේ තදලෙසම සිතට කරදර ඇත උසස් අයගෙන්ද තමාට විපත්ති ඇතිවිය හැකි බැවින් මේ කාලයේදී කල්පනාවෙන් ඒ අය ආශ්‍රය කලයුතුයි

## සෞඛ්‍යය

පවතින සෙනසුරු ගේ ඒරාශ්ටක අපල වලට නිතර පිලියම් ආදිය කරනවානම් ශරීර සෞඛ්‍යය යහපත්වේ ලෙඩදුක් ආදිය තුරන්වී ශරීර සැපය ඇතිකරයි නැතිනම් කේතු දොලොස්වැන්නේ ගමන් කරන කාලයේදී සුලු වශයෙන් තුවාලයක් වත් සැදුනොත් එය තදබල අසාධ්‍ය තත්වයකට වුවද හැරෙන්නට පුලුවන් කාලයකි බොවෙන රෝග ආදියටද පහසුවෙන් පෘත්‍රුවිය හැක ඇස්වල දත්වල පතුල් වල ආභාද හා පිත් කෝප රෝගද වැලදෙන්නට ඉඩ තිබේ නැතිනම් වේදනා ගෙන දෙනසන්ධි ආභාධයක් හෝ පාදයක අමාරුවක් වන්නට පුලුවන

## කන්‍යා ලග්නය

ගුරුගේ දශා අතුරුදශා ගතවන අයට පවතින අනිකුත් අපල වලට ප්‍රතිකර්ම කරනවානම් මෙය සුබදායක කාලයක් නිසා පහත කියන සුබපල තරමක් වැඩිපුර ලැබෙන්නට පුලුවනි

සෙනසුරුගේ කේතුගේ හා රාහුගේ දශා අන්තර්දශා ගතවන අයට දැනට පවතින ග්‍රහඅපල ආදියට නිතර නිතර ප්‍රතිකර්ම කලේ නැතිනම් මෙය තරමක අසුබ කාලයක් නිසා මෙම වසරේදී ලැබිය යුතු සුබපල අඩුකරන්නට පුලුවනි ඒනිසා මේකාලයේදී පවතින අපල වලට නිතර ශාන්තිකරම ආදිය කිරීමෙන් මෙම වසරේදී වඩාත් සුබදායක ප්‍රතිපල ලබාගන්නට පුලුවනි අන් අයට මධම පලයි

## රැකීරක්ෂා හා ධනය

පවතින සෙනසුරු ගේ ඒරාශ්ටක අපල වලට පිලියම් ආදිය කරනවානම් කේතු එකොලොස්වැන්නේ ගමන් කරන කාලයේදී වැඩි දියුනුවට කටයුතු සැලසේ මිලමුදල් තත්වය උසස්වේ ආදායම් ලැබෙන මාර්ග වැඩිවේ අලුත් ඇඳුම් පැලඳුම් ආභරන වර්ග ලැබෙන්නටද හේතුයි බලාපොරොත්තු රහිත හදිසි ධන ලාබ ලැබේ කරගෙනයන වැඩකටයුතු සාර්තක වේ තමා ඉගනගත්දෙය රටට ප්‍රසිධ වේ තම

තත්වය ස්තිර වීමට හෝ තත්වයෙන් උසස්වීමට ඉඩ ලැබේ දේපල ලාභද වාහන ලාභද ඇතිවිය හැකිය මහන්සිවී කල වැඩකින් ලාභ ප්‍රයෝජන හා ප්‍රසංසා ලැබෙනවා ඇත සිටින තැනින් බටහිරට හෝ නැගෙනහිරට දුර ගමනක් යාමටද සිදුවියහැක  ගොඩනැගිලි වැඩ අලුත්වැඩියා ආදිය හෝ වාහන ලාභ හෝ නිතර ගමන් බිමන් ආදියද ඇතිවේ

නමුත් පවතින සෙනසුරු අපල වලට පිලියම් කලේ නැතිනම් තම ආදායම අඩුවෙන බැවින් නය තුරුස් ආදිය ඇතිවීමටද පුලුවන සිතේ තීන්දුවකට බැසීමට නොහැකි කරුනු ඇතිවේ වියදම් අධික කරයි සමහරවිට ස්තානවල හෝ කරගෙන ආ කටයුතුවල වෙනසක් ද ඇතිකල හැක නොතේරුම් කමින් හෝ තමා නොදැනම වැරදි සිදුවේ ධන හානියක්ද ඇතිවන කාලයකි මහන්සියෙන් කල වැඩක ප්‍රයෝජන ගෘනිමට සූදානම් වන විටම එය අවහිර වී යාමට කරුනු යෙදෙන්නට පුලුවන රුවටීම් වලට පහසුවෙන් අසුවියහැකි කාලයක් නිසා ව්‍යාපාර හෝ විවාහ සහකරුවන් නැතිනම් කොන්ත්‍රාත් කරුවන් හෝ හවුල්කරුවන් සොයාගැනීමේදී මේ කාලය තුල ප්‍රවේසම් වීම හොදයි

## ගෘහ ජීවිතය

ශනි 12 වැන්නේ ගමන්කරන කාලය හෙවත් ලග්න ඒරාශ්ටකය ගතවන නිසා මෙය අපල දායක කාලයකි පවතින සෙනසුරු අපල වලට පිලියම් කලේ නැතිනම් අසනීප හා ධන හානි වලට හේතුයි සිත් තැවුල් ගහන වේ අදහස් කරන කටයුතුවලට සෑම පැත්තෙන්ම කරදර හාධා ඇතිකල හැකියි පවුලේ අයට මාපිය ගුරුවරාදී වැඩිහිටියන්ට අපලද දුප්පත් වීමද යන විපත් සිදුවීමට පුලුවන කැඩුම්බිදුම් වැටීම් ගෙඩි වන නිසා ශරීරයේ තුවාල සාදන්නට පුලුවන මුදල් හානිවේ නිකරුනේ වියදම් යන කටයුතු ඇතිවේ සමහර විට දැන දැනම නිශ්පල දෙයට මුදල් වියදම් කරන්නට සිදුවේ මෙය අපල කාලයක් බැවින් නිතර මහාමෘතුංජය වැනි මන්ත්‍රයක් භාවිතා කිරිමෙන් හෝ සෙනසුරු සතෝත්‍රය කියවීමෙන් ජය සැප හා දියුනුව සැලසේ එසේ කරනවානම් මවුපිය හෝ වැඩිහිටි ඥාතින්ට යහපත සැලසෙන කාලයකි ගෙදර දොර වාසනාව උදාවන කාලයකි අලුත් හිතමිතුරන් මිතුරියන් ආශ්‍රයට ලැබෙනවා ඇත අඩුපාඩු නැතිව ජයට කෑම බීමාදියද ලැබෙන්නට පුලුවන ආදායම් ලැබෙන මාර්ග වැඩිවේ අලුත් ඇදුම් පැලදුම් ආභරන වර්ග ලැබෙන්නටද හේතුයි

## සෞඛ්‍යය

පවතින සෙනසුරු අපල වලට පිලියම් කලේ නැතිනම් ශනි 12 වැන්නේ ගමන්කරන කාලය අසනීප හා ධන හානි වලට හේතුයි මෙය අපල දායක කාලයකි අනතුරු වලින් ලෙඩදුක් වලින් ප්‍රවේසම් විය යුතුය  කැඩුම්බිදුම් වැටීම් ගෙඩි වන නිසා ශරීරයේ තුවාල සාදන්නට පුලුවන ශරීරයේ මුහුනේකැලැල් සාදන්නටද දත්වල ආභාධ ඇතිවීමටද පුලුවන දරු ශිශ්‍යාදීන්ට අසනීප කරදර හෝ අපල අපදුව ඇතිකරන කාලයකි උදරාබාධයකටද හේතුයි මුලු පවුලටම අපල කාලයකි ධන හානි සිත් කරදර ලෙඩ රෝග පාඩු අලාභ ඇතිවිය හැකි නිසා මේ කාලය තුල බොහෝ දුරට ඉවසිලි වන්තව සිටීම නුවනට හුරුයි

## තුලා ලග්නය

සෙනසුරුගේ  දශා අතුරුදශා ගතවන අයට පවතින අනිකුත් අපල වලට ප්‍රතිකර්ම කරනවානම්  මෙය සුබදායක කාලයක් නිසා පහත කියන සුබපල තරමක් වැඩිපුර ලැබෙන්නට පුලුවනි

ගුරුගේ  කේතුගේ හා රාහුගේ දශා අන්තර්දශා ගතවන අයට දැනට පවතින ග්‍රහඅපල ආදියට නිතර නිතර ප්‍රතිකර්ම කලේ නැතිනම්  මෙය තරමක අසුබ කාලයක් නිසා මෙම වසරේදී ලැබිය යුතු සුබපල අඩුකරන්නට පුලුවනි ඒනිසා මේකාලයේදී පවතින අපල වලට නිතර ශාන්තිකරම ආදිය කිරීමෙන් මෙම වසරේදී වඩාත් සුබදායක ප්‍රතිපල ලබාගන්නට පුලුවනි අන් අයට මධම පලයි

## රැකීරක්ෂා හා ධනය

තම අදහසට අනුව වැඩ කටයුතු හා ගෙදර දොර කටයුතු සිදුවේ සිතට සැනසීම ගෙන දෙන කාලයකි විශේශ දියුනුවකට මග පෑදීමටද පුලුවන තම තත්වය ඉහලයයි අලුත් තනතුරු රැකීරක්ෂා ආදිය මේ කාලයේදී ලැබෙන්නටද පුලුවන තත්වයට සුදුසු තනතුරු ආදිය ලැබේ සිතට නිදහස සැනසීම හා ප්‍රීතිය ඇතිවේ දේපල ගෙවල් ඉඩම් උරුම හිමිකම් ආදිය නිසා පල ප්‍රයෝජන ලැබෙන හා අලුත් ස්තානවල පදිංචියට යාමට ලැබෙන්නටද පුලුවන් කාලයකි වෙනකෙනෙක්  හෝ පවුලේ වෙන කෙනෙක් මහන්සිවී කල වැඩක පල ප්‍රයෝජන තමන්ටද නිරායාසයෙන් නෙලාගැනීමට ලැබේ තමා කල සේවයේ රක්ෂාවේ ප්‍රතිපල හෙවත් එකවර ලැබෙන්නට තිබෙන පඩි මුදල් බෝනස් ආදිය ලැබන්නටපුලුවන් කාලයයි පොත් පත් ආදියෙන් නම ප්‍රසිධ වේ

## ගෘහ ජීවිතය

පවතින අපල වලට පිලියම් කලේ නැතිනම් ගුරු ග්‍රහයා ඔබේ රාෂි කේන්ද්‍රයේ  **3** වැන්න හරහා ගමන් කරන මේ කාලය තුල කලින්කී සුබපල ලැබෙන අතරම ටිකක් පවුලේ  කරදරද ඇතිකරන්නට පුලුවන පවුලේ අයගෙන් ඥාති මිත්‍රාදීන්ගෙන් ඇන්වීමහෝ ඒ අයට අපල ඇතිකරයි වෙහෙස ඇති කරදර කාරී ගමන් යාමට සිදුවේ ඇතැම්විට සිතට සැක ඇතිව සෑම දෙයක්ම කරන්නට සිදුවේ අවුල් වියවුල් තඩු පැටලිලිහෝ හෘදයේ තද තිගැස්සීම් හය කම්පාවීම් ඇතිකරයි අනතුරු හිරිහැර ආදියට මුහුනදෙන්නට සිදධවිය හැකි කාලයක් නිසා ප්‍රවේසම් විය යුතුය පදිංචිය පිලිබද කරදරද ඇති කලහැක නමුත් පවතින අපල වලට පිලියම් ආදිය කරනවානම් උගත් අයගෙන් ඒවා විසදාගැනීමට පහසු උපදේශ හා උපකාර ලැබෙනවා ඇත තදකරදර ඇතිවුවත් ඒවායින් පහසුනේ නිදහස් විමට අනුන්ගෙන් උපකාරද ලැබේ  ඥතියෙකුගේ නැතිනම් ලගම මිතුරෙකුගේ විවාහය හෝ තත්වය උසස් වීමක් සිදුවේ

## සෞඛ්‍යය

මේ කාලසීමාව මවුපිය වැඩිහිටියන්ට අපල දායකය අනතුරු හිරිහැර ආදියට මුහුනදෙන්නට සිදධවිය හැකි කාලයක් නිසා ප්‍රවේසම් විය යුතුය

## වාෂ්වික ලග්නය

ගුරුගේ හා රාහු ගේ  දශා අතුරුදශා ගතවන අයට පවතින අනිකුත් අපල වලට ප්‍රතිකර්ම කරනවානම්  මෙය සුබදායක කාලයක් නිසා පහත කියන සුබපල තරමක් වැඩිපුර ලැබෙන්නට පුලුවනි

සෙනසුරුගේ  කේතුගේ හා රවි ගේ දශා අන්තර්දශා ගතවන අයට දැනට පවතින ග්‍රහඅපල ආදියට නිතර නිතර ප්‍රතිකර්ම කලේ නැතිනම්  මෙය තරමක අසුබ කාලයක් නිසා මෙම වසරේදී ලැබිය යුතු සුබපල අඩුකරන්නට පුලුවනි ඒනිසා මේකාලයේදී පවතින අපල වලට නිතර ශාන්තිකරම ආදිය කිරීමෙන් මෙම වසරේදී වඩාත් සුබදායක ප්‍රතිපල ලබාගන්නට පුලුවනි අන් අයට මධම පලයි

## රැකීරක්ෂා හා ධනය

පවතින අපල වලට පිලියම් ආදිය කරනවා නම් රාහු තුන්වැන්නේ ගමන් කරන මේ කාලයේදී ආදායම වැඩිවේ මිත්‍රයන්ගෙන් උපකාරද සැලකිලිද ලැබේ අත්හැර දමා තිබූ වැඩකටයුතු නැවත අලුත්වීමෙන් දියුනුවද තම බලය වැඩිවීමද අසල්වැසියන්ගෙන් ලගඥාතීන්ගෙන් හා දුරබැහැර සිටින මිත්‍රයන්ගෙන් උපකාර ලැබීමද පරන වැඩකටයුතු නැවත පටන් ගැනීමට ඉඩ පහසුකම් ලැබීමද සමාජයෙහි තැනක් ලැබීමද මේකාලයේ සිදුවන්නට පුල අලුත් වැඩ කටයුතු වලට හෝ රැකීරක්ෂාවලට බැදෙන්නට හෝ සිදුවන කරුනු ඇති කරත් ව්‍යාපාර ආදී කටයුතු වලින්ද ජය හා ලාභ ලැබෙන කාලයකි

නමුත් පවතින අපල වලට පිලියම් කලේ නැතිනම්  නරක ප්‍රතිපල වශයෙන් ඉගනීමේ හා රැකිරක්ෂා ආදියේ කටයුතු අතපසුවීයාමටත්  හානි මුදල් හානි ඇතිකරන්නටත්  තත්වය පහලට වැටෙන්නටත් ඉඩ ඇත කරන කියන කටයුතු අවුල් සහිතව කෙලවර වේ එසේම අසල් වැසියන්ගෙන්ද නැත්නම් අන්‍ය ආශ්‍රය කරන්නන්ගෙන් හෝ තමාට කරදර හේතුවන කටයුතු ඇතිවේ

## ගෘහ ජීවිතය

මා කලින්ද කී ලෙස පවතින අපල වලට පිලියම් ආදිය කරනවා නම් මෙය සැපවත් කාලයකි රසවත් කෑමබීම සංග්‍රහ ආදිය ලැබෙන්නට පුලුවන වාසනාව මතුවේ උත්සව පවත්වන්නට සිදුවේ නැතහොත් උත්සව වලට සහභාගිවීමට ඉඩලැබේ ඥාති මිත්‍රයෝද මේකාලයට තමා සොයාගෙන එති ශුද්ධ භූමි වලට යාමටද ඉඩප්‍රස්තා ලැබේ සතුරන්ගෙන් ජය ලැබේ ශරීර සනීපයද ඇතිවේ වටිනා දේ මිලට ගැනීමට ලැබේ පවුලේ පිරිස වැඩිවේ නැතිනම් දරු උපත්  ආදිය ඇති කාලයකි ගෙදරදොර වාසනාව හා විවාහ මංගල්‍ය ආදියද ප්‍රිය සමාගම්ද ඇතිවේ සමිති සමාගම් වල තනතුරු හෝ කථා පැවැත්වීම් ආදියටද ආරාධනාවන් ලැබෙන්නට ඉඩ ඇත

## සෞඛ්‍යය

පවුලේ කෙනෙකුට හෝ පවුලේ වැඩිහිටියෙකුට විපත්ති දායක කාලයකි තමාටද ගමන් අනතුරු සිත්තැවුල් දුක් දොම්නස ධන හානි මුදල් හානි ඇතිකරන කාලයකි ශරීරාභාධද ඇතිකලහැකියි දරුශිෂ්‍යාදීන් නිසා හෝ නෑනා මස්සිනාලා නිසාහෝ ඇත ඥාතීන් නිසා හෝ කරදර හා පාඩුද එවැනි හිතවත් අයට විපත්තිද ඇතිකරන කාලයකි

## ධනු ලග්නය

සෙනසුරුගේ ගුරුගේ කේතුගේ හා රාහුගේ දශා අන්තර්දශා ගතවන අයට දැනට පවතින ග්‍රහඅපල ආදියට නිතර නිතර ප්‍රතිකර්ම කලේ නැතිනම් මෙය තරමක අසුබ කාලයක් නිසා මෙම වසරේදී ලැබිය යුතු සුබපල අඩුකරන්නට පුලුවනි ඒනිසා මේකාලයේදී පවතින අපල වලට නිතර ශාන්තිකරම ආදිය කිරීමෙන් මෙම වසරේදී වඩාත් සුබදායක ප්‍රතිපල ලබාගන්නට පුලුවනි අන් අයට මධම පලයි

## රැකීරක්ෂා හා ධනය

පවතින අපල වලට පිලියම් කලේ නැතිනම් ගුරු ලග්නයේ ගමන්කරන මේ කාලය වියදම් අධික කරයි දුර බැහැර ගමනක් යාමට සිදුවේ තද සිත්තැවුලක්ද ඇතිවේ ස්තාන මාරුවීමකටද බොහෝ සෙයින් ඉඩ තිබේ එය රක්ෂාව පිලිබද වීමට හෝ නැතිනම් පදිංචිය පිලිබදව වීමටද හේතුයි උසස් අය සමග ආරවුල් හෝ උසස් අය තමා ගැන අප්‍රසන්න වීමට හෝ හේතු තිබෙන බැවින් ඉතා පරිස්සමෙන් හා නුවනින් යුතුව ක්‍රියා කල යුතු කාලයකි මේකාලයේදී තමාගේ නම නරක් වීමටද හිතේ තිබුන ප්‍රීතිය සමාදානය නැතිවීමටද පුලුවන නොයෙකුත් ක්‍රම වලින් එකපිට කරදර වැඩිවේගන යන බවක් හිතට දැනෙන කාලයකි ශනි 9 වැන්නේ ගමන්කරන මේකාලයේදී ස්තාන වෙනස් වීමක් හෝ ගෙදරින් පිටයාමට සිදුවීමක් හෝ කාර්යාලීය වෙනසක් හෝ නිතර නිදාගන්නා තැන වෙනස්වීමක් නියමයි ධන ලාබද ලැබෙන මුත් එය වහා නැතිවේ ප්‍රයෝජනයක් නැති දෙයට උත්සාහ කරන්ටත් වියදම් කරන්නටත් සිද්වේ නොයෙකුත් ක්‍රම වලින් කරදර ඇතිවේ විභාග තඩුහබ තරග ආදියෙන් ලොකු ජයග්‍රහන බලාපොරොත්තු නොවිය යුතු සාමාන්‍යයෙන් අවාසනාවන්ත කාලයකි ඒනිසා මෙම තත්වය මග හරවාගැනීමටනම් පවතින අපල වලට නිතර සෙත් ශාන්ති කරගත යුතුවේ

## ගෘහ ජීවිතය

මා කලින්ද කී ලෙස පවතින අපල වලට පිලියම් ආදිය කරගත්තේ නැතිනම් විශේෂයෙන් මැයි මාසයෙන් පසු වසරේ අග භාගය තරමක අවාසනාවන්ත කාලයකි සතුරන් ඉර්ෂියාකාරයන් ඇතිවේ කරගෙන ආ කටයුතු වලට බාධා ඇතිවේ නඩුහබ වලට පවා පැටලෙන්නට පුලුවන දිනපතාකෙරිගෙන ආ තමාගේ වැඩ කටයුතු වෙනස්වේ පිනට දහමට හත යොමුවේ දේව භක්තිය වැඩිවේ මව්පිය වැඩිහිටියන්ගේ ලෙඩදුක් ආදී කරදර නිසා සිතට දුක් ඇතිවේ සමහරවිටක එවැනි කෙනෙකුට හෝ අන්‍ය හිතවතෙකුට තදබල අපල ඇතිවිය හැක වියදම් අධික වේ වැඩිහිටියන් ඥාතීන් සමග කරන කටයුතුවලදී නොතේරුම් කමින් හෝ වැරදීම් ඇතිවීමෙන් හෝ අලාබහානි කරදර පාඩු සිත්තැවුලු ආදිය විදීමට සිදුවේ දුර ගමන් යාමට සිදුවේ ගෙදරදොර කරදර හා පවුලේ අයගෙන්ම තමාට නොගැලපෙන

කතාද කටයුතුද ඇතිවන බැවින් ගෙදරදී සාමාන්‍යයෙන් කෙරිගෙන ආ වැඩකටයුතු පිලිවෙල ටික දවසකටවත් නැවතිමට හෝ වෙනස් පිලිවලකට කරන්නට සිදුවේ

## සෞඛ්‍යය

ශරීර සනීපය අඩුවේ තදලෙප කේන්තියයි දත්වල ආබාධ ඇතිවීමටද පුලුවන ශරීරසනීපය දුර්වල කරයි හිතවත් ඥාතියෙකුට හෝ මිත්‍රයෙකුට අපල කාලයකි ශරීරය වෙහෙසකරන ගමන්බිමන් හෝ වැඩ කටයුතු නිතරපාහේ හෝ දිනපතාම ඇතිවේ කේතු අටවැන්නේ ගමන් කරන කාලයේදී ශරීරයේ ලේ හිගවීම නැතහොත් ලේ නරක්වීමෙන් සෑදෙන රෝග ඇතිවිමද උල් ආයුද වලින් තුවාල හෝ ශල්‍යකරම ආදිය ඇතිවීමද වැනි අපල ඇතිකිරීමට ඉඩ ඇත හදිසි අනතුරු පීඩා අසනීප තුවාල ආදිය ඇතිකල හැකි කාලයක් නිසා ප්‍රවේසම් විය යුතුය

## මකර ලග්නය

සෙනසුරුගේ සඳුගේ ගුරුගේ  කේතුගේ හා රාහුගේ දශා අන්තර්දශා ගතවන අයට දැනට පවතින ග්‍රහඅපල ආදියට නිතර නිතර ප්‍රතිකර්ම කලේ නැතිනම් මෙය තරමක අසුබ කාලයක් නිසා මෙම වසරේදී ලැබිය යුතු සුබපල අඩුකරන්නට පුලුවනි ඒනිසා මේකාලයේදී පවතින අපල වලට නිතර ශාන්තිකරම ආදිය කිරීමෙන් මෙම වසරේදී වඩාත් සුබදායක ප්‍රතිපල ලබාගන්නට පුලුවනි අන් අයට මධම පලයි

## රැකීරක්ෂා හා ධනය

අනාගත ලාභ බලාපොරොත්තුවෙන් මුදල් වියදම්කර යම් යම් වැඩ කටයුතු කරන්නට සිදුවේ නමුත් ඒවායින් ලාභ ප්‍රයෝජන ලැබෙන්නේ තව වසර දෙකක් පමන ගතවූපසුය  පවුලේ අයගේ හා දූදරුවන්ගේ දියුනුවට මුදල් වියදම් කිරීමටද කටයුතු සැලසේ ඒවායින්ද මතුවට ප්‍රයෝජන ලැබෙනවා ඇත එසේම රහසිගතව හෝ නිර්නාමිකව යම් යම් දේට මුදල් වියදම් කිරිමට සිදුවේ සමහරවිට පුන්‍යවැඩවලට හෝ අසරනයන්ට උදවු කරන කාලයකි එහෙත් ආශ්‍රය කරන්නන්ගෙන් බරපතල ලෙස කරදර සිත්තැවුල් ඉර්පියාකාර කම් හෝ තම කටයුතු වලට හාධාකිරීම් ඇතිවිය හැකි නිසා නිතරම සිත් තැවුලෙන් කාලය ගතවේ වියදම් අධික වීමත් මුදල් හානියත් නිතරම ඇතිවේ මේකාලයේදී ගෙවල් ඉඩම් වලට වියදම් කරන මුදල් පසුවට ප්‍රයෝජන ඇතිකරයි

## ගෘහ ජීවිතය

සෙනසුරු  8 වැන්නේ ගමන්කරන අශ්ටම ඒරාශ්ටක අපල කාලයක් නිසා පවතින සෙනසුරු අපල වලට පිලියම් කලේ නැතිනම් මේ කාලය ජීවිතයේ එක් අවාසනාවන්ත අමුතුම කාල පරිච්ජේදයකි  දුක්  කනගාටු වරින්වර ඇතිවෙත් ඥාතීන්ට විපත්ති දායකයි ඥීතින් සමග අමනාපකම් මතුවේ නඩු හබ වලට

අසුවීමටද ඉඩකඩ ඇත පියාට හෝ පියපක්‍ෂයේ වැඩිහිටියෙකුට නැතිනම් වැඩිමල් දරුවාට අපල දායක කාලයකි නරක පහත් අයගේ ආශ්‍රය හෝ එවැනි අය ගෙන් තමාට කරදර පාඩු නින්දා ආදිය ඇතිවිමට පුලුවන පදිංචි ස්තානය වෙනස් විය හැකියි නොයෙකුත් ක්‍රම වලින් සිත් කරදර කනගාටු ඇතිවේ නුවමනා හිරිහැර වලට අසුවේ ක්‍රමානුකූල ජීවිතයක් ගෙනයාමට නොලැබේ රාහුද දූර්වලව ලග්නයේගමන් කරන කාලයක්බැවින් ගමන් බිමන් අධිකවේ එකතැනක සිටීමට අකමැතිවේ තමන්ගෙන් ඉල්ලාගත් දෙය පවා ආපසු නොලැබේ බොරු චෝදනා ලැබෙන්නට පුලුවන සොරුන්ගෙන්ද භය ඇති කරයි රාත්‍රී ගමන් වලින් වැලකීම හොදයි වැඩ කටයුතුවලින් කරදර හා අවිවේකයද ඇතිවේ සිත් තැවුල් ඇතිවීමට හේතු වන කරුනු සිදුවේ පවුලේ අය සමගද ආරවුල් ඇතිවිය හැකි බැවින් ඉවසීමෙන් ක්‍රියාකල යුතුයි

## සෞඛ්‍යය

සෙනසුරු 8 වැන්නේ ගමන්කරන අශ්ටම ශ්රාශ්ටක අපල කාලයක් නිසා පවතින සෙනසුරු අපල වලට පිලියම් කලේ නැතිනම් ශනි 8 වැන්නේ ගමන්කරන කාලයේදි ශරීර පීඩා අසනීප හෘදයාබාධ ලේ දෝෂ අර්ශස් ආබාධ ලේ හිගවීම ලේ විෂවීම මලපහවීමේ දෝෂ බෝවෙන රෝග ආදී අසනීප සෑදෙන්නට පුලුවන එය සමහරවිට තමාට හෝ තම පවුලේ අයට සෑදෙන්නට ඉඩ තිබේ යටිබඩේ හෝ ඇස්වල ආබාධ හෝ හදිසි අනතුරුද මේකාලයේ ඇතිවන්නට පුලුවන් නිසා ප්‍රවේසම් විය යුතුය අනිකුත් සුලු සුලු ශරීරාභාධ ගැනත් සැලකිලිමත්ව සිටිම හොදයි කෑම නොදිරවීමේ ආභාධ හෝ ආහාර ගැනීමට අප්‍රිය ගතියක් ඇතිවේ සිතට භය සහිතව කාලය ගතකිරීමට සිදුවේ හමේ දෝශ කැසීම් වැනි ආභාධ වුවද මේ කාලයේදී ඇතිකරන්නට පුලුවනි

# කුම්භ ලග්නය

ගුරුගේ කේතුගේ දශා අතුරුදශා ගතවන අයට පවතින අනිකුත් අපල වලට ප්‍රතිකර්ම කරනවානම් මෙය සුබදායක කාලයක් නිසා පහත කියන සුබපල තරමක් වැඩිපුර ලැබෙන්නට පුලුවනි

කුජගේ හා රාහුගේ දශා අන්තර්දශා ගතවන අයට දැනට පවතින ග්‍රහඅපල ආදියට නිතර නිතර ප්‍රතිකර්ම කලේ නැතිනම් මෙය තරමක අසුබ කාලයක් නිසා මෙම වසරේදී ලැබිය යුතු සුබපල අඩුකරන්නට පුලුවනි ඒනිසා මේකාලයේදී පවතින අපල වලට නිතර ශාන්තිකරම ආදිය කිරීමෙන් මෙම වසරේදී වඩාත් සුබදායක ප්‍රතිපල ලබාගන්නට පුලුවනි අන් අයට මධම පලයි

# රැකීරක්‍ෂා හා ධනය

නැතිවූ දේපල වස්තුව හෝ නැතිවීගිය තනතුරු රැකීරක්‍ෂා ආදිය නැවත ලැබීමත් මෙතෙක් පැවති අසනීප ගති නැතිවී සුවවීමත් ඇති කාලයකි පිටපලාතක සිටියානම් නැවත ගේදොර ගමරට බලා එන්නට සිත්වේ සෑම දෙයින්ම ලාභප්‍රයෝජන ලැබෙන කාලයකි බොහෝවිට මෙම තත්වය ඇතිවනුයේ මෙම

කාලයේ මුල් කොටසේදී නොව පසු භාගයේදීය ශරීර සැප පහසුවද ගෙදර දොර සැනසිලිදායක තත්වයද ඇතිවේ ආදායමද ක්‍රමයෙන් වැඩිවේ කරදර වලින් නිදහස ලැබේ දියුනුව ඇතිකරන කාලයකි ලාභ ප්‍රයෝජන ලැබෙන කාලයකි දේපල ස්තානලාභ ලැබෙන්නටද ඉඩ ඇත

එසේ වුවත් කුජගේ හා රාහුගේ දශා අන්තර්දශා ගතවන අයට පවතින අපල වලට පිලියම් කලේ නැතිනම් වසරේ මුල් භාගය තුල ටිකක් දුෂ්කර ගති ඇතිකරන්නට පුලුවන කරගෙන යන රැකීරක්ෂාවලට අවහිරකම් හෝ සතුරුකරදර හෝ වැඩ වැඩිකමින් ප්‍රමාදවීම් ආදිය ඇතිකරයි සිතේ සැනසීම අඩු කාලයකි රැකීරක්ෂා වලින් මේකාලයේදී පහල වැටුනොත් නැවත ඒ තත්වයට නැගිසිටීමට ගන්නා උත්සාහයන්ගේ ප්‍රතිපල හීන වියහැකි නිසා කරන කියන රැකීරක්ෂා කටයුතු හෝ ඉගනීම් කටයුතු ආරක්ෂාකරගැනීමට උත්සාහකලයුතු කාලයකි

## ගෘහ ජීවිතය

පවතින අපල වලට පිලියම් ආදිය කරනවානම් මෙම වසර පවුලේ වාසනාවන්ත ප්‍රීතිදායන කාලයකි පවුලේ විවාහ මංගල්‍ය දරු ශිෂ්‍ය ලාභ ආදිය ඇතිකරන කාලයකි අලංකාරයෙන් හා උසස් ලෙස ජීවත්වීමට අවශ්‍ය බඩුමුට්ටු ලැබෙන්නට හේතුයි වාසනාවන්ත ප්‍රිය සම්භාෂන ආදිය පැවැත්වීමට අවශ්‍ය ඉඩ පහසුකම්ද උපකාරද ලැබෙනවා ඇත ශනි ගුරුගේ දෘෂ්ටි ලැබ 7 වැන්නේ ගමන්කරන මේ කාලයේදී තමාම යම් යම් දේ සොයා දැනගෙන උසස් වීමට ඉඩ ප්‍රස්තා සලසා ගනී තද උත්සාහයෙන් කරන වැඩ වලින් ප්‍රයෝජන ලැබේ කරදර වලින් නිදහස ලැබේ දියුනුව ඇතිකරන කාලයකි ලාභ ප්‍රයෝජන ලැබෙන කාලයකි

### සෞඛ්‍යය

හිරිවාතාදී ආභාධද ලිංගාභාධ හිරිවාත අජීර්න රෝග වැලදෙන්නට ඉඩ තිබේ ශරීරයේ සෙම් පිත් ආදියෙහි අසමානකම් තුන්දොස් කෝප ඇතිවේ මේකාලය මවුට හෝ මවුපස ඥාතීන්ට තරමක් අගුන කාලයකි

## මීන ලග්නය

සෙනසුරුගේ හා රාහුගේ දශා අතුරුදශා ගතවන අයට පවතින අනිකුත් අපල වලට ප්‍රතිකර්ම කරනවානම් මෙය සුබදායක කාලයක් නිසා පහත කියන සුබපල තරමක් වැඩිපුර ලැබෙන්නට පුලුවනි

ගුරුගේ හා කේතුගේ දශා අන්තර්දශා ගතවන අයට දැනට පවතින ග්‍රහඅපල ආදියට නිතර නිතර ප්‍රතිකර්ම කලේ නැතිනම් මෙය තරමක අසුබ කාලයක් නිසා මෙම වසරේදී ලැබිය යුතු සුබපල අඩුකරන්නට පුලුවනි ඒනිසා මේකාලයේදී පවතින අපල වලට නිතර ශාන්තිකරම ආදිය කිරීමෙන් මෙම වසරේදී වඩාත් සුබදායක ප්‍රතිපල ලබාගන්නට පුලුවනි අන් අයට මධම පලයි

## රැකීරක්ෂා හා ධනය

පවතින අපල වලට පිලියම් ආදිය කරනවානම් දියුනුවට කටයුතු සැලසේ හොද ආහාරපාන හා ධන ලාබ ලැබේ නයතුරුස් වලින් නිදහසහෝ නය ගනුදෙනුවකින් ලාහ ලැබේ කරන කියන සෑම කටයුතු වලින්ම ලාහ හා දියුනුව ඇතිවේ සැප පහසුවට අවශ්‍ය ඇදපුටු බඩු බාහිරාදිය හා වාහන මිලදීගන්නට ලැබේ ස්තාන වෙනස්වීමකටත් ඉඩතිබේ රැකීරක්ෂාවලින් උසස්වීමට හෝ අමුතුවෙන් රක්ෂාවක් සොයාගැනීමට උත්සාහ කරන කාලයකි

ගුරු ග්‍රහයා ඔබේ රාෂි කේන්ද්‍රයේ 10 වැන්න හරහා ගමන් කරන කාලයක්නිසා පවතින අපල වලට පිලියම් කලේ නැතිනම් මිල මුදල දේපල හානි ඇතිවිය හැකි කාලයකි දියුනුවට ගන්නාවූ අධික උත්සාහයේ ප්‍රතිපල නොලැබේ තත්වය පහල වැටෙන්නටත් ස්තාන වෙනස්වීමකටත් ඉඩතිබේ ගමන් බිමන් අධික වෙනත් ඒවායින් ප්‍රයෝජන ලැබෙන්නේ ඉතා ටික වශයෙනි මුදල් අතින් නිතර අමාරුකම් ඇතිවේ උසස් අය සමග ආරවුල් කරගන්නට කරුනු යෙදේ අවාසනාවන්ත දායක ස්තාන වෙනස්වීමක් හෝ තත්වයෙන් පහල වැටෙන ආකාරයට කටයුතු වෙනස්වීමක් හෝ ඇතිවිය හැකිබැවින් පරිස්සම් වියයුතුයි

## ගෘහ ජීවිතය

පවතින අපල වලට පිලියම් ආදිය කරනවානම් මෙම වසර වඩා සුබ පල ඇතිකරන කාලයකි ශනි 6 වැන්නේ ගමන්කරන කාලයේදී සතුරන්ගෙන් ජය ලැබේ සතුරන් පරාජය කලහැකි කාලයකි ලෙඩරෝග ඇතිනම් ඒවායින් සුවය ලැබේ ශරීරයේ පෙනුම හොදවේ ස්ත්‍රී පුරුෂ හිතවතුන් හිතවතියන් සමග ආශ්‍රය ඇතිවේ දේපල දියුනුවේ වාසනාවන්ත ප්‍රීතිමත් කාලයකි දියුනුවට කටයුතු සැලසේ හොද ආහාරපාන හා ධන ලාබ ලැබේ කරන කියන සෑම කටයුතු වලින්ම ලාහ හා දියුනුව ඇතිවේ උසස් අය සමග ආශ්‍රය කිරමටත් ඔවුන් සමග හිත මිත්‍රකම් පැවැත්වීමටත් අවස්තාව ලැබෙන්නට පුලුවන පවුලේ දියුනුවටද හේතුයි බලාපොරොත්තු රහිත හදිසි මිලමුදල් ලාහ ලැබෙන්නටද පුලුවන ඉඩකඩම් වාහන ගෙවල්දොරවල් ආදිය ලැබෙන්නටද මංගල්‍ය කටයුතු ස්තිරවන්නට හෝ ඒවායේ යෙදෙන්නට ඒවාට සහභාගීවනනටද ඉඩ ලැබේ වාසනාවන්ත කාලයකි තම රැකීරක්ෂා තනතුරු ආදිය දියුනුවේ අලුත් මිත්‍රයන් නෑදෑයන් ලැබෙන්නටද පුලුවන

## සෞඛ්‍යය

පවතින අපල වලට පිලියම් කලේ නැතිනම් ඥාතියෙකු හෝ මිත්‍රයෙකු ගැන කනගාටු දායක ආරංචි ලැබේ ගෙදරදොර ආරවුල් හෝ අසනීපකම් නිතර ඇතිවේ ශරීර සනීපය අඩු කරයි කේතු පස්වැන්නේ ගමන් කරන මේ කාලයේදී සතුරන් ඊර්ෂියාකාරයින් ඇතිවේ පවුලේ අයට හා දරුදැරියන්ට අසනීපාදී කරදර ඇතිකරන කාලයකි මිලමුදල් හානි ඇතිවේ ශෝක වීමට කරුනු ඇතිවේ හදිසි අනතුරු වලින් ප්‍රවේසම් විය යුතුය ශරීරයේ තුවාල ඇතිකලහැකි කාලයකි